www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කාර්මික ක්‍රියා සඳහා අයිතිය රැකීමට ශ්‍රී ලාංකික කම්කරුවෝ පිකට් කරති

## Sri Lankan workers picket to defend right to industrial action

**අපේ ලියුම්කරුවන් විසිනි**

**2007 ඔක්තෝබර් 10**

උසාවිය යොදා ගනිමින් ආන්ඩුව විසින් වැටුප් සහ රැකියා සම්බන්ධ කාර්මික ක්‍රියාවන් නීති විරෝධී කිරීමට විරෝධය පාමින්, දුම්රිය, සෞඛ්‍ය, විශ්වවිද්‍යාල, පාසැල්, විදුලි සංදේශ, වරාය ඇතුලු රාජ්‍ය අංශයේ සහ ජනමාධ්‍ය සහ නිදහස් වෙලඳ කලාපයේ කම්කරුවෝ 2000 පමන ඔක්තෝබර් 3 කොලඹ කොටුව දුම්රිය පොල ඉදිරිපිට පිකට් උද්ඝෝෂනයක නිරත වූහ.

උසස් පෙල විභාගයේ ප්‍රශ්න පත්‍ර අගැයීම ගුරුවරුන් විසින් වර්ජනය කිරීම උපරිමාධිකරනය විසින් තහනම් කිරීමෙන් පසු රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති හැට හතක් විසින් මෙම විරෝධතා උද්ඝෝෂනය කැඳවුම් කලේ ය.

වර්ජනය නතර කරන ලෙස අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීම සඳහා වෘත්තිය සමිති පහක් අධිකරනයට කැඳවී ය. සැප්තැම්බර් 13 රාජ්‍ය අංශයේ දසදහස් ගනනක් ගුරුවරුන් එක් දින වර්ජනයකට සම්බන්ධවීමෙන් ඉක්බිතිව ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව මෙම දන්ඩන නීතිය ක්‍රියාවට දැමී ය.

පසුගිය සතියේ විරෝධතා උද්ඝෝෂනය දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව ආන්ඩුව ගෙන යන වියදම් සහගත වාර්ගික යුද්ධයේ ප්‍රතිවිපාකයන් ලෙස ජීවනතත්වයන් සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කරන ආන්ඩුවේ ප්‍රහාර ඉහල යාමට විරුද්ධව කම්කරුවන් අතර වැඩෙන කෝපය තවත් ආකාරයකින් ප්‍රදර්ශනය කිරීමකි. අනෙක් අතින් පිකට් උද්ඝෝෂනයේ සීමිත ස්වභාවය මගින් කම්කරුවන්ගේ විරුද්ධත්වය පාලනය කිරීමේ සහ කම්කරුවන් මුහුන දෙන අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රශ්න යටගැසීමේ වෘත්තීය සමිතිවල ක්‍රියා කලාපය ඉස්මතු කර පෙන්වයි.

එක් ප්‍රශ්නයකට පමනක් උද්ඝෝෂනය සීමා කිරීමට වෘත්තීය සමිති නායකයෝ පරිස්සම් වූහ. ප්‍රද්ර්ශන පුවරුවල වූයේ එක් සටන් පාඨයක් පමනි: අධිකරනය හරහා වෘත්තීය සමිති මර්දනය නතර කරනු! පිකට් උද්ඝෝෂනය තුල සටන් පාඨ හඬ නැගීම ද මෙම තනි ප්‍රශ්නයට සීමා විය. යුද්ධය ගැන කිසි ම දෙයක් සඳහන් කලේ නැත.

උද්ඝෝෂනයට කම්කරුවන්ගේ සම්බන්ධ වීමේ සාපේක්ෂ අඩු වීම සිදු වූයේ ආන්ඩුවේ ප්‍රහාර කෙරෙහි ඔවුන්ගේ විරුද්ධත්වයේ කවර හෝ අඩුවක් නිසා නො වේ. වෘත්තීය සමිති නිලධරය හිතාමතාම සහභාගිත්වය සීමා කිරීමේ ප්‍රතිඵලයක් ය. විරෝධතා උද්ඝෝෂනය කොලඹ එක් ස්ථානයක දී පැවැත්වෙන දහවල් කෑම පැයට සීමා කලේ ය. මහජන රැලියක් සංවිධානය කිරීමේ පලල් උද්ඝෝෂනයක් නොවී ය.

වෘත්තීය සමිතිවල ක්‍රියාකලාපය විවේචනය කරමින් කම්කරුවන් ගනනාවක් ම ලෝක සමාජවාදී වෙබ් අඩවියට සිය අදහස් ප්‍රකාශ කලහ.

"මා මෙම උද්ඝෝෂනය ගැන දැන නොසිටි නිසා මට එයට සහභාගි වීමට නොහැකි විය. කම්කරුවන්ගේ සහ මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් රුදුරු ලෙස මර්දනය කරන රාජපක්ෂ ආන්ඩුවට අප විරුද්ධයි. උද්ඝෝෂනය හරියට සංවිධානය නොකිරීම ගැන වෘත්තීය සමිති නායකයින්ට චෝදනා කරනවා. ඒ නිසා බොහෝ කම්කරුවන්ට උද්ඝෝෂනයට සම්බන්ධ වීමට හැකි වුනේ නැහැ" හලාවත පාසල් ගුරුවරයෙක් පැවසී ය.

උද්ඝෝෂනයෙන් ඉක්බිතිව පැවති කෙටි රැස්වීමේ දී සමිති 67 කැඳවුම්කරු සමන් රත්නප්‍රිය කම්කරුවන් අමතමින් මෙසේ කියිවාරු ගැසී ය. "සමහර ඇමතිවරු කියනවා කම්කරු අරගල මර්දනය කිරීමේ ඉන්ජෙක්සන් එකක් ඒගොල්ලො ලඟ තියෙනවා කියලා. නමුත් අප කියනවා ඔබව මර්දනය කිරීමේ ඉන්ජෙක්සන් එකක් දැන් අප ලඟ තියෙනවා.... ඔබ ඔබගේ මර්දනය අකුලා ගන්නෙ නැත්නම්, කම්කරුවන් ඔබව දනගස්සාවි."

දුම්රිය වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුනේ (දුවෘසඒපෙ) ප්‍රධාන ලේකම් සම්පත් රාජිත ඇතුලු සෙසු සමිති නායකයන්ගේ කථා ඊට නොවෙනස් ය. ජීවන තත්වයන්ට සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ආන්ඩුවේ ප්‍රහාරයන්ට පිටුපසින් පවත්නා යුද්ධය ගැන කිසිදු කථිකයෙකු කථා නොකලේ ය. යුද්ධයට විශාල වියදමක් දැරීමට සිදුව ඇති හෙයින් කම්කරුවන්ගේ පඩි ඉල්ලීම් දීමට නොහැකි බව රාජපක්ෂ සහ ආන්ඩුවේ ඇමතිවරු ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කර ඇත්තාහ.

වර්ජන හා විරෝධතා ව්‍යාපාරවලට ප්‍රතිචාර දැක්වීමේ දී "ජාතික ආරක්ෂාව" අනතුරේ හෙලන හෝ ත්‍රස්තවාදීන්ට උදව් කරන" ද්‍රෝහීන් ලෙස ආන්ඩුව කම්කරුවන්ව හෙලා දැක ඇත. පොලීසිය යොදාගෙන උද්ඝෝෂන කඩාකප්පල් කරන අතර අධිකරනය යොදාගෙන කාර්මික ක්‍රියා මර්දනය කරයි. මෙම ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට විරුද්ධවනවා වෙනුවට, යුද්ධය ගැන කිසිවක් කථා නොකරන සමිති නායකයෝ යුද වියදම් දැවැන්ත ලෙස ඉහල දැමීම යුක්ති යුක්ත දෙයක් ලෙස නොපැකිල පිලිගෙන සිටිති.

නැගෙනහිරට මෙන්ම උතුරට යුද්ධය දිගේලි කර ඇති ආන්ඩුව දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති එහි 2008 අයවැය ඇස්තමේන්තු තුල යුද වියදම සියයට 20න් ඉහල නගින බව පෙන්නුම් කර ඇත. කම්කරු පන්තිය සම්බන්ධයෙන් මෙහි තේරුම වන්නේ තව දුරටත් දරුනු ලෙස ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කප්පාදු කිරීමකි.

උද්ඝෝෂනය සඳහා සමාජවාදී සමානතා පක්ෂය (සසප) බෙදා හල පත්‍රිකාවේ පැහැදිලි කල පරිදි යුද්ධයට විරුද්ධවීමේ දේශපාලන ක්‍රියාමාර්ගයකින් තොරව කම්කරුවන්ට ඔවුන්ගේ අති මූලික අයිතීන් පවා රැක ගැනීමට පුලුවන් කමක් නැත. එසේ වුවත් වෘත්තීය සමිති නායකයන් මෙම ප්‍රශ්නය මතු කිරීම ප්‍රතික්ෂේප කර ඇතුවා පමනක් නොව, උද්ඝෝෂනය "පලල් කිරීමේ" නාමයෙන් යුද්ධයට ක්‍රියාශීලීව සහයෝගය දෙන හෝ යුද්ධය අනුමත කර ඇති පක්ෂ සමඟ සංධානයන් සඳහා ප්‍රයත්නයක යෙදී සිටිති.

පක්ෂයේ සහයෝගය ඉල්ලා සිටීමට වෘත්තීය සමිති නායකයෝ මෑත දී දක්ෂිනාංශික විරුද්ධ පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ (එජාප) නායක රනිල් වික්‍රමසිංහ හමු වූහ. එජාපය ජාතික සේවක සංගමයේ නායකයන් සහ සාමාජිකයන් කිහිප දෙනෙකු පිකට් උද්ඝෝෂනයට එවී ය.

1980 යුද්ධය ආරම්භ කල එජාපය 2001 බලයට යලි පත් වූ විට ඊනියා ජාත්‍යන්තර "සාම ක්‍රියාවලිය" වැලඳගත්තේ ය. එහි මතය වෙනස් වූයේ සාමාන්‍ය වැඩ කරන ජනයා කෙරෙහි සැලකිලිමත් වීමක් නිසා නො වේ. ඊට විපරීතව, සිදු වුනේ විදේශ ආයෝජන සහ ලාභ සඳහා බාධාවක් ලෙස යුද්ධය දැකගත් බලගතු ව්‍යාපාරික උත්සුකතාවයන්ට අනුකූලතාවය දැක්වීමකි.

2005 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරනයෙන් පරාජය වීමෙන් පසුව එජාපය වඩවඩා ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව විසින් යලි ආරම්භ කල යුද්ධයට අනුගත විය. විවෘතව ම ස්වෝත්තමවාදී වූ පක්ෂවලට ගතමනාවක් දීමක් ලෙස එජාපය 2002 අත්සන් කල සටන් විරාමය කරා ආපසු ඒමක් සිදු නොවන අතර තව දුරටත් 2002 සහ 2003 කාල පරිච්ඡේදයේ එල්ටීටීඊය සමග ඇති කර ගත් සීමිත එකගතාවය ද අතහැර දමා තිබේ.

එජාප නායකයන් පිරිහෙන ජීවන තත්වයන් ගැන බොරු උනන්දුවක් දැන් පෙන්නන නමුත් අලුතෙන් බලයට පත් වන එජාප ආන්ඩුවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන වෙලඳපොල ප්‍රතිසංස්කරන තීව්‍ර කරනු ඇත.

එහෙත් එජාපය ඔවුන්ගේ ජීවන තත්වයන් සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ගැන උනන්දුවක් දක්වන්නේ යැයි කම්කරුවන් රැවටීමේ උත්සාහයක සමිති නායකයෝ නිරතව සිටිති. විශේෂයෙන්ම අවස්ථාවාදී නව සම සමාජ පක්ෂය (නසසප) එවන් සංධානයක් සඳහා උද්ඝෝෂනයක නිරතව සිටී. නසසප නායකයෙකු වූ එක්සත් කම්කරු සම්මේලනයේ (එකස) සභාපති ලීනස් ජයතිලක "ආන්ඩුවේ මර්දනයට මුහුන දීම සඳහා පලල් මහජන ව්‍යාපාරයක් ගොඩ නැගීමට සියලු දේශපාලන භේද සහ පක්ෂ පාට පසෙකින් තබන" ලෙස ඔක්තෝබර් 3 උද්ඝෝෂකයන් ගෙන් ඉල්ලා සිටියේ ය.

ඒ සමග ම එල්ටීටීඊය සමූලෝත්පාඨනය කිරීම සඳහා සර්ව පාර්ශවීය යුද්ධයක් දියත් කරන ලෙස ආන්ඩුවෙන් සහ මිලිටරියෙන් ඉල්ලා සිටින ජාතික හෙල උරුමය (ජාහෙඋ) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී පක්ෂවල සහයෝගය ලබා ගැනීමේ ප්‍රයත්නයක ද සමිති නායකයෝ යෙදී සිටිති. ජවිපෙට සම්බන්ධ ලංකා ගුරුසේවා සංගමය උසාවියට කැඳවූ ගුරු සංගම්වලින් එකක් වූ නමුත් ජවිපෙ උද්ඝෝෂනයට සම්බන්ධ නොවී ය. ජාතික හෙල උරුමය පාලක සංධානයේ කොටසක් වන අතර ජවිපෙ පාර්ලිමේන්තුව තුල ආන්ඩුවට බැකිම දෙමින් පක්ෂ දෙකම ආන්ඩුවට සහයෝගය දෙති.

"ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකීමට නම් කම්කරුවන් යුද්ධයට විරුද්ධ විය යුතුය" යි අවධාරනය කරමින් ඔක්තෝබර් 3 උද්ඝෝෂනය සඳහා සසප ප්‍රකාශයක් නිකුත් කල අතර එහි සාමාජිකයෝ උද්ඝෝෂකයන් අතර සහ අනෙකුත් වැඩපලවල එහි පිටපත් දහස් ගනනක් බෙදූහ.

## 'යුද්ධයට විරුද්ධව සටන් පාඨ පුවරුවක් නැතිව අප පිකට් කරන්නේ කෙසේ ද?'

ඔක්තෝබර් 3 පිකට් උද්ඝෝෂනයේ දී ලෝසවෙඅ සමග කථාකල කම්කරුවෝ ආන්ඩුව සහ වෘත්තීය සමිති නායකයන් කෙරෙහි කෝපය ප්‍රකාශ කලහ.

හලාවත ගුරුවරයෙක් මෙසේ පැවසීය: "මා ඔබගේ පත්‍රිකාව කියෙව්වා දිග් ගැස්සුන යුද්ධය මේ ප්‍රහාරවල කේන්ද්‍රීය කාරනය බව මා හිතනවා. යුද්ධයට

විරුද්ධව එකම සටන් පාඨයක්වත් මා මෙම උද්ඝෝෂනයේ දී දැක්කේ නැහැ. විදේශිකයෙක් රූපවාහිනියෙන් මේ උද්ඝෝෂනය නැරඹුවනම් ඔහු හිතන්නෙ නැහැ මෙය ශ්‍රී ලංකාවේ කම්කරුවන්ගේ ක්‍රියාවක් කියලා. දශක ගනනාවක් යුද්ධය නිසා විනාශකාරී ප්‍රතිවිපාකවලට මුහුන දී සිටින අපට මේ ලේවැකි යුද්ධයට එරෙහි එක සටන් පාඨයක්වත් නැතිව උද්ඝෝෂනය කරන්න පුලුවන් ද?

"ඔබ දන්නවාද ඇයි ඔවුන් යුද්ධයට විරුද්ධ සටන් පාඨ මතු නොකලේ? වෘත්තීය සමිති නායකයන් නිශ්චිතව ම දන්නවා රාජපක්ෂ අහපු ප්‍රශ්නයට ඔවුන්ට උත්තරයක් නැති බවඃ ඔබ මට කියන්නේ උතුරෙන් සහ නැගෙනහිරෙන් හමුදාව ඉවත් කරන්නද? රාජපක්ෂ අහල තිබුනා."

කොම්පඤ්ඤවීදියේ ගුරුවරයෙකු අදහස් දක්වමින්ඃ "ජීවන තත්වයන් සහ රැකියා ආරක්ෂා කර ගැනීම සඳහා වර්ජනය කිරීමට ඇති අයිතිය කම්කරු පන්තියේ මූලික අයිතියක්. ආන්ඩුව පෙර නොවූ ආකාරයට ඒ අයිතිය උල්ලංඝනය කර තියෙනවා. මානව අයිතීන් ආරක්ෂා කරන බව ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු නැවත නැවතත් ප්‍රකාශ කලත් අප දකින්නේ ඔවුන් මහජනතාවගේ සෑම මූලික අයිතියක් ම උල්ලංඝනය කරන බව. රාජපක්ෂගේ මේ කෙටි පාලන කාලය තුල මිනිස්සු කොපමනක් මැරුවාද? අතුරුදහන්වූ අවතැන් වූ අය කොපමන ද?

"පඩි ඉල්ලීම් සම්බන්ධව ගුරුවරු වර්ජනය කිරීම ආන්ඩුව සහ සමහර ජනමාධ්‍ය විසින් හෙලාදකිනවා. එය ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවලට විරුද්ධවීමක් බව ඔවුන් කියනවා. ප්‍රමානවත් ආදායමක් නැතිව වැඩ කිරීමට සහ ජීවත්වීමට පුලුවන් කියලා ඔබ හිතනාවා ද? අපේ අයිතීන් සඳහා සටන් කිරීම වැරැද්දක් නෙමෙයි. අපට චෝදනා කරන ආන්ඩුව අධ්‍යාපන ක්‍රමය විනාශ කරනවා.

"අපේ නායකයන් කියන විධිහට එජාපය සමග එකතු වෙලා කිසිම අයිතියක් ආරක්ෂා කරන්න බැහැ. එජාපය හෝ ශ්‍රීලනිපය අතර කිසිම වෙනසක් මා දකින්නේ නෑ. 1980 වර්ජනය මතක්කර ගන්න. සොච්චම් වැටුප් වැඩිවීමක් ඉල්ලීම නිසා කම්කරුවන් 100,000ක් රැකියාවලින් දොට්ට දැම්මාඃ යුද්ධය පටන් ගත්තේ එජාපය.

"මා ඔබේ පත්‍රිකාව තවමත් සම්පූර්නයෙන්ම කියෙව්වේ නැහැ. කොහොම නමුත් යුද්ධයට විරුද්ධව සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකීම සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත සිංහල දෙමල කම්කරුවන් එකමුතු කල යුතුයැයි ඔබ කියන කාරනාවට මා එකඟයි."

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ සේවකයෙක්ඃ "කම්කරු පන්තියේ අරගලවලට විරුද්ධව අධිකරනයේ මැදිහත්වීම මගින් මූලික අයිතියක් උල්ලංඝනය වෙනවා. මැතිවරනයේ දී පොරොන්දු වූ ආකාරයට එකම ප්‍රශ්නයක් වත් විසඳිය නොහැකි නිසයි රාජපක්ෂ ආන්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනය කරන්න පටන් ගෙන තියෙන්නෙ.

"මහජනතාවට ජීවන බර දරාගන්න බැහැ. පසුගිය සතියේ ආන්ඩුව පාන් පිටි සහ පාන් මිල නැවතත් වැඩි කලා. මාසික වැටුපෙන් තුනෙන් එකකටත් වැඩියෙන් වියදම් වෙන්නේ කෑමට සහ ගමන් වියදම්වලට. මාසිකව මගේ අතට ලැබෙන මුදල රුපියල් 10,000 පමන. මට ලමයි දෙන්නෙක් ඉන්නවා. ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා අඩුම ගනනේ මාසෙකට රුපියල් 3,000ක් වියදම් වෙනවා. බිරිඳට රැකියාවක් නැහැ.

"ජනාධිපතිවරනයේ දී මා ඡන්දය දුන්නේ රාජපක්ෂට. කිසිම දේශපාලන පක්ෂයක් ගැන මට දැන් විශ්වාසයක් නැහැ. එජාප, ජවිපෙ, හෙල උරුමය, ඔක්කොම එකයි. ඔවුන් අපව රවට්ටලා අපේ ඡන්දය ගන්නවා. මේ උද්ඝෝෂනයට සම්බන්ධ වුනාට සමිති නායකයන් ගැනත් මට විශ්වාසයක් නැහැ." ජූනි මාසයේ වැටුප් අරගලය වෘත්තීය සමිති විසින් පාවා දුන් ආකාරය ඔහු විස්තර කලේ ය. "ආන්ඩුව කම්කරුවන් අට දෙනෙකුගේ වැඩ තහනම් කිරීම ඇතුලුව දඬුවම් ක්‍රියාවල යෙදුනත් වෘත්තීය සමිති කම්කරුවන් ආරක්ෂා කිරීමට කිසිවක් ම කලේ නැහැ."